ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - **2023/2024**

අවසාන පරීක්ෂණය

5 වන මට්ටම

LLU5712 - පොදු අන්තර්ජාතික නීතිය

කාලය පැය (03) තුනයි.

---

දිනය - 2025 මැයි 11 වේලාව - ප.ව. 01.30 – ප.ව.04.30

---

<u>ප්‍රශ්න ගණන 08 යි.</u>

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>

**අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

1) (අ) සම්මුතීන් යනු චාරිත්‍ර සංග්‍රහිත කිරීම සහ පිළිගත් සහ හඳුනාගත් ශිෂ්ටසම්පන්න ජාතීන්ගේ පොදු පරිචයන් මඟින් නව රීති නිර්මාණය කිරීම නම් එය යම්තාක් දුරකට සම්මුතීන් චාරිත්‍රයන්හි ප්‍රකාශනයක් බවට සාක්ෂි දරයි.

ඉහත ප්‍රකාශයේ වලංගුභාවය අදාළ නෛතික බලධාරීත්වයන් සමඟ විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

(ආ) ආරවුල් නිරාකරණය සම්බන්ධයෙන් අන්තර්ජාතික නීතියේ මූලාග්‍ර ලැයිස්තුවක් තිබුණද, පාර්ශ්වයන් එකඟ වන්නේ නම් සමානාත්මතාවය සහ සාධාරණත්වය මත පදනම්ව ආරවුල් විසඳීමට බලය අන්තර්ජාතික යුක්ති අධිකරණයට ඇත්දැයි ඔබ එකඟ වන්නේද? උදාහරණ සපයන්න.

(ලකුණු 05)

**(15 + 05 = ලකුණු 20)**

2) මිත්‍රා මාධව යනු බූමි නම් දිවයිනේ තරුණ ක්‍රියාකාරිනියක් සහ ප්‍රසිද්ධ විකට රංගන ශිල්පිණියකි. සමාජ මාධ්‍යයේ ප්‍රචාරණය වුණු ඇගේ විකට රංගනයන් අතරතුර රටේ ආගම්වලට අපහාස කිරීම සහ වෛරී සහගත ප්‍රචාරණයක් සිදුකිරීම සම්බන්ධ චෝදනාවට ඇයව 2025 අප්‍රේල් 05 වන දින පොලීසිය විසින් අත්අඩංගුවට ගනු ලැබිණි. ඇයගේ ඉදිරිපත් කිරීමේ සංස්කරණය කරන ලද කොටසක් සමාජ මාධ්‍යය වල දැඩි විරෝධතාවයට ලක්විය. බූමි රාජ්‍යයේ අන්තර්ජාතික සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් සන්ධාන පනත (ICCPR) යටතේ මිත්‍රාට චෝදනා එල්ල විය. පනතේ 05 සහ 06 වගන්ති වලින් පිළිවෙලින් සඳහන් වන්නේ චේතනාන්විතව ආගම්වලට හානි සිදු කිරීම සහ ඕනෑම තරාතිරමක පුද්ගලයන්ගේ ආගමික හැඟීම් කෝපයට පත් කිරීම ද්වේශ සහගත ලෙස සිදු කිරීම අපරාධයක් බවයි. මෙම පනත බූමි රාජ්‍යයේ අන්තර්ජාතික බැඳියාව දක්වන අන්තර්ජාතික සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් සන්ධානයේ (ICCPR) හැකි කරවන ව්‍යවස්ථාවයි. මිත්‍රාට විරුද්ධව ගොනු කරන ලද නඩුව ලබන සතියේ විභාග කිරීමට නියමිතයි.

ඒ අතරතුර බූමි රාජ්‍යයේ මානව ක්‍රියාකාරීන් සහ වියතුන් ඊට ප්‍රතිචාර දක්වමින් අවධාරණය කරන්නේ මෙම සිද්ධිය භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස සහ ICCPR දේශීය නීතියට අන්තර්ග්‍රහණය කිරීමට බූමි රාජ්‍යයට ඇති අන්තර්ජාතික නීතිමය බැඳියාව උල්ලංඝනය කිරීමක් බවයි.

බූමි රාජ්‍යයේ දේශීය සහ අන්තර්ජාතික නෛතික බැඳියාවන් ශ්‍රී ලංකාවට සමාන බව උපකල්පනය කරන්න.

ඔබ මෙම නඩුවේ විනිසුරුවරයා නම් ඔබගේ විවේචනාත්මක තීරණය වන්නේ කුමක්ද? නෛතික අධිකාරීන් ඇසුරින් ඔබේ තීරණයට හේතු දක්වන්න.

(ලකුණු 20)

3) අදාල නෛතික උදාහරණ දක්වමින් පහත ප්‍රකාශයන්ගේ වලංගුභාවය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(අ) අන්තර්ජාතික ප්‍රජාවේ නිසි ආයතනයන් විසින් සාමූහික ආරක්ෂාව අනුමත කළ යුතුය.

(ලකුණු 10)

(ආ) සමකාලීන අන්තර්ජාතික නීතිය තුළ භූමි ප්‍රදේශයන් අත්පත් කර ගැනීමේ ක්‍රමවේදයන් වෙනස් වී ඇත.

(ලකුණු 10)

**(10+10= ලකුණු 20)**

4) බූමි සහ බිස්තාන් යනු 'මූර්' නම් භූමිය හිමිකර ගැනීම සඳහා වූ භෞමික ආරවුලක් සම්බන්ධයෙන් කටුක සබඳතාවයක ඉතිහාසයක් ඇති අසල්වැසි රාජ්‍යයන් වේ. බූමි සහ බිස්තාන් යන රාජ්‍යයන් දෙකම පොදුවේ පවත්වා ගෙන යන බිම් තීරයන්හි මූර් පිහිටා ඇත. කෙසේ වෙතත්, බූමි සහ බිස්තාන් පිළිගත් ජාත්‍යන්තර නීතිරීතිවලට අනුකූලව ඔවුන්ගේ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පවත්වාගෙන ගියේය. මෙම සන්දර්භය තුළ, 2025 අප්‍රේල් මස මුලදී, බිස්තාන් රාජ්‍යයේ ත්‍රස්තවාදීන් පිරිසක් 'පර්ල්' නම් බූමි රාජ්‍යයේ අභ්‍යන්තර දේශසීමාවේ ස්වභාව සෞන්දර්ය නරඹමින් සිටි සංචාරකයින්ව ඝාතනය කළහ.

සිද්ධියෙන් පසුව, බූමි හි බුද්ධි අංශය වාර්තාවක් හෙළි කළේ බිස්තානයේ ත්‍රස්තවාදීන් බූමි හි බිස්තාන් තානාපති සිම්ප්සන්ගේ දැනුමෙන් සහ සහාය ඇතිව ඝාතන සිදු කළ බවයි. ප්‍රහාරය සිදු වූ දිනයේදී, බූමි හි බිස්තාන් මහ කොමසාරිස් කාර්යාලයට කේක් එකක් භාර දුන් බවත් සිම්ප්සන් පෞද්ගලික සාදයක් පැවැත්වූ බවත් සොයා ගන්නා ලදී. බිස්තානයේ ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාරයට සහ තානාපති සිම්ප්සන්ගේ සම්බන්ධයක් ඇතැයි කියන චෝදනාවට ප්‍රතිචාර වශයෙන්, බූමි රාජ්‍යය බිස්තාන් රාජ්‍යයට එරෙහිව පළිගැනීමක් වශයෙන් ගනු ලබන රාජ්‍ය තාන්ත්‍රික පියවර ගණනාවක් නිවේදනය කළේය.

මෙම පියවරයන් අතර බූමි සහ බිස්ටාන් අතර සියලුම ද්විපාර්ශ්වික ගිවිසුම් අත්හිටුවීම, රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පහත හෙලීම සහ බූමි සහ බිස්ටාන් අතර විශේෂ වීසා වැඩසටහන් ඉවත් කිරීම ඇතුළත් වේ. මෙයට ප්‍රතිචාර වශයෙන් බිස්ටාන් ප්‍රකාශ කළේ බූමි රාජ්‍යයේ පළිගැනීමේ පියවරයන් ත්‍රස්ත ප්‍රහාරයට බිස්ටාන් රාජ්‍යයේ නිශ්චිත මැදිහත්වීමක් ඇඟවුම් කරන බවත් එය පිළිගත නොහැකි බවත්ය. කෙසේ වුවද, තානාපති සිම්ප්සන්ට ලබා දී ඇති රාජ්‍ය තාන්ත්‍රික මුක්තිය පහත හෙලීමට ගත් තීරණය බිස්ටාන් නිවේදනය කළ අතර ඔහුට එරෙහිව පරීක්ෂණයක් ආරම්භ කිරීම සඳහා කැමැත්ත ප්‍රකාශ කළේය.

ඉහත සිද්ධියෙන් පැන නගින නීතිමය ප්‍රතිවිපාක සාකච්ඡා කිරීමට ජාත්‍යන්තර නීතිය පිළිබඳ ඔබේ දැනුම භාවිතා කරන්න. සුදුසු උදාහරණ ඇසුරින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

**(ලකුණු 20)**

5) සම්මුතිමය නීතිය සම්බන්ධ ඔබේ දැනුම භාවිතයෙන් පහත ප්‍රකාශවල වලංගුභාවය සාකච්ඡා කරන්න. ඔබේ සාකච්ඡාවට අදාළ නෛතික ප්‍රතිපාදන සහ උදාහරණ ඇතුළත් විය යුතුය.

(අ) තම හරයාත්මක බැඳියාවන් දේශීය ඉස්ලාම් මූලධර්ම සහ පරිචයන් උදාහරණ වශයෙන් කාන්තාවන් සහ අනුප්‍රාප්තිය සම්බන්ධ කාරණයන් සමග නොගැලපෙන බැවින් බොහෝ ඉස්ලාමීය

රාජ්‍යයන් 1979 කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ වෙනස්කම් පිටුදැකීමේ එක්සත් ජාතීන්ගෙන් සම්මුතියේ (CEDAW) හරයාත්මක බැඳියාවන් ඇතුළත් ඇතැම් ප්‍රතිපාදන සීමා කොට ඇත. (Reserved)

**(ලකුණු 08)**

(ආ) සියලු බලය සහිත වූ ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාට රාජ්‍ය වෙනුවෙන් සම්මුති අපරානුමත කිරීමට හැකිය.

(ලකුණු 06)

(ඇ) සම්මුතියක සාමාන්‍ය අර්ථය නිරර්ථක වූ විට රාජ්‍යයන්ට අතිරේක අර්ථකථන වෙත යොමුවීමට අන්තර්ජාතික නීතිය රාජ්‍යයන්ට ඉඩ සලසා ඇත.

(ලකුණු 06)

**(08+06+06 = 20 Marks)**

6) ආරක්ෂක මණ්ඩලය,

2001 සැප්තැම්බර් 11 වන දින නිව්යෝර්ක්, වොෂින්ටන් ඩී.සී. සහ පෙන්සිල්වේනියාවේ සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාර සම්බන්ධයෙන් එහි නිසැක හෙළා දකින බවට නැවත ප්‍රතිඥා දෙමින් සහ එවැනි සියලු ක්‍රියා වැළැක්වීමට එහි අධිෂ්ඨානය ප්‍රකාශ කරමින්,...

සියලුම රාජ්‍යයන් ...

(ආ) ත්‍රස්තවාදී ක්‍රියා සිදු කිරීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගත යුතුය, ඇතුළුව

තොරතුරු හුවමාරු කර ගැනීමෙන් අනෙකුත් රාජ්‍යයන්ට පූර්ව අනතුරු ඇඟවීමක් ලබා දීම;

(ඇ) විශේෂයෙන් ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික විධිවිධාන හරහා සහයෝගයෙන් කටයුතු කිරීම සහ

ගිවිසුම් හරහා, ත්‍රස්තවාදී ප්‍රහාර වැළැක්වීම සහ මර්දනය කිරීම සහ එවැනි ක්‍රියාවන්ගේ වැරදිකරුවන්ට එරෙහිව පියවර ගැනීම සියලු රාජ්‍යයන් කළ යුතුය.

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාව 1373 (2001 සැප්තැම්බර් 28)

ඉහත සඳහන් ආරක්ෂක මණ්ඩල යෝජනාවට අනුව, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය ආත්මාරක්ෂාව යටතේ ක්‍රියා කරන රාජ්‍යයන්ට වඩාත් ප්‍රතිග්‍රාහී වන ආකාරය, විශේෂයෙන් 2001 සැප්තැම්බර් මාසයෙන් පසු එක්සත් ජනපදයේ ප්‍රහාරයේ සන්දර්භය තුළ සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

**07 සහ 08 ප්‍රශ්න වලට පහත සිද්ධිය ඇසුරින් පිළිතුරු සපයන්න.**

'එඬේරුන්ගේ නිම්නය' යන අර්ථය ඇති 'ගෝඩින්' යනු පර්ල් රාජ්‍යයේ වැඩිපුරම සංචාරය කරන සංචාරක ගමනාන්තයයි. 'ගෝඩින්' පර්ල් රාජ්‍යයේ මායිමේ පිහිටා ඇති අතර, පර්ල් රාජ්‍යය සහ එහි අසල්වැසි රාජ්‍ය වන රූබි රාජ්‍යය අතර දේශසීමා ප්‍රශ්නයක් පවතී. 2025 අප්‍රේල් 10 වන දින ප.ව. 2 ට පමණ, ආවරණය කරගත් ඇඳුම් ඇඳගත් සන්නද්ධ කණ්ඩායමක් අසල වනාන්තරයකින් මතු වී 'ගෝඩින්' හි සංචාරකයින්ට පහර දුන්හ. මෙම ප්‍රහාරයේ ප්‍රතිඵලයක් ලෙස, පර්ල් රාජ්‍යයේ පුරවැසියන් වන සංචාරකයින් 260 ක් ඝාතනය වූ අතර තවත් දොළොස් දෙනෙක් තුවාල ලැබූහ. පර්ල් රාජ්‍යයේ අසල්වැසි රාජ්‍යයේ පරිසර අමාත්‍ය ෂෙල්ඩන් , රත්නා ලෙස හඳුන්වනු ලබන අතර, ඔහුගේ පවුලේ අය සමඟ එදින පෞද්ගලික සංචාරයක් සඳහා 'ගෝඩින්' හි සිටියේය. ෂෙල්ඩන් සහ ඔහුගේ මුළු පවුලම මෙම ප්‍රහාරයෙන් මිය ගියහ.

සිද්ධියෙන් පසු පර්ල් රාජ්‍යයේ බුද්ධි අංශය වාර්තාවක් නිකුත් කරමින් කියා සිටියේ, රූබි රාජ්‍යයේ කැරලිකාර කණ්ඩායමක් පවතින දේශසීමා ආරවුල සම්බන්ධයෙන් පර්ල් රාජ්‍ය වෙත මෙම ප්‍රහාරය ගැන අනතුරු ඇඟවීමක් ප්‍රකාශ කළ බවයි. කෙසේ වෙතත්, ප්‍රහාරයට ආධාර කිරීම, අනුබල දීම සහ සැලසුම් කිරීම පාලනය කරනු ලැබුවේ වයිරා රාජ්‍යයේ හි ක්‍රියාත්මක වන 'බ්ලැක් මිස්ටර්ස්' නම් පැරාමිලිටරි කණ්ඩායමක් විසින් බව ද වාර්තාවෙන් හෙළි විය. වයිරා රාජ්‍යයේ ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරීන් 'බ්ලැක් මිස්ටර්ස්' හි උපදේශකයින් වූ බවත්, වයිරා රාජ්‍යයේ ඉහළම ආරක්ෂක ධූරාවලිය ක්‍රියා කළේ ප්‍රහාරය සිදුවන බව දැනගෙන බවත්, විමර්ශනය කිරීමට හෝ පර්ල් රාජ්‍යයට දැනුම් දීමට කිසිදු පියවරක් නොගත් බවත් බුද්ධි වාර්තාව සහතික කරයි.

7) ජාත්‍යන්තර නීතියේ අධිකරණ බලයේ මූලධර්ම භාවිතා කරමින්, ලබා දී ඇති සිද්ධියට රාජ්‍යයන්ට ඔවුන්ගේ අයිතීන් සඳහා සම්බන්ධ විය හැක්කේ කෙසේද? අදාළ නීතිමය උදාහරණ සමඟ සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

8) ඉහත දක්වා ඇති සිද්ධියට වයිරා රාජ්‍යය වගකිව යුතු බවට ප්‍රකාශ කිරීමට පර්ල් රාජ්‍යයට ඇති නීතිමය විසඳුම් සාකච්ඡා කරන්න. නීතිමය උදාහරණ සපයන්න.

(ලකුණු 20)

හිමිකම් ඇවිරිණි.